

# සබරගමුව පළාත් උපාධිධාරි ලියාපදිංචි කිරිමෙ වැඩසටහන

## සාරාංශ වාර්තාව - 2019

තොරතුරු, පර්යේෂණ හා විශේෂ ව්‍යාපෘති දෙපාර්තමේන්තුව,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ක්‍රමසම්පාදන) කාර්යාලය
සබරගමුව පළාත් සභාව.

## හැඳින්වීම

සබරගමුව පළාත තුලින් වාර්ෂිකව උසස් අධ්‍යාපනය අවසන් කරන කණ්ඩායම හඳුනා ගැනීමේ වැඩසටහන නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ක්‍රමසම්පාදන) කාර්යාලය මගින් ක්‍රියාත්මක කරනු ලබයි. මේ යටතේ උපාධිධාරීන් හා ඩිප්ලෝමාධාරීන් ලෙස කාණ්ඩ දෙකක් යටතේ සමීක්ෂණය සිදුකරණු ලබයි.

මින් උපාධි පාඨමාලාවන් හදාරා උසස් අධ්‍යාපනය අවසන් කරන කණ්ඩායම වෘත්තීයමය උපාධිධාරීන් ලෙස හා වෘත්තීයමය නොවන ලෙස කාණ්ඩ දෙකක් ලෙස හඳුනාගත හැකිය. එයින් වෘත්තීයමය නොවන උපාධිලාභීන් රැකියා වෙළඳපොල තුලින් තම රැකියාව සොයාගත යුතුය.

එයින් කොටසක් දේශීය හා විදේශීයව පෞද්ගලික අංශයේ රැකියා සඳහා යොමුවේ. එසේම බහුතර පිරිසක් ‘රජයේ රැකියාවක්’ ලබාගැනීම අපේක්ෂා කර ගනිමින් රැදී සිටී. මේ අතරින් කොටසකගේ මූලික හා ප්‍රමුඛතම අපේක්ෂාව ‘රජයේ රැකියාව’ කරගනිමින් සිටින අතර තවත් කොටසක් රැකියා වෙළඳපොල ඉල්ලුමට ප්‍රමාණවත් නොවන උපාධි පාඨමාලාවන් වීම මත රජයේ රැකියා අපේක්ෂාවෙන් රැඳීසිටී.

වාර්ෂිකව සිදු කෙරෙන උපාධිධාරීන් ලියාපදිංචි කිරීමේ වැඩසටහන සඳහා රජයේ රැකියාවක් අපේක්ෂා කරන හා රජයේ හෝ පෞද්ලික අංශයේ ඌන සේවාවන් හි නිරත උපාධිධාරීන් යොමුවේ.

මෙම පිරිස වාර්ෂයකට 1500-2000 පමණ වන අතර වාර්ෂිකව පළාතේ බිහිවන උපාධිධාරීන් සංඛ්‍යාවෙන් 70%-80% පමණ වනු ඇත.

මෙම සංෂිප්ත වාර්තාව මගින් 2019 වර්ෂයේ සිදුකරණ ලද උපාධිධාරී ලියාපදිංචි කිරීම 1910කට අදාල විශ්ලේෂණාත්මක තොරතුරු ඉදිරිපත් කර ඇත. ඒ යටතේ පහත දැක්වෙන ශිර්ෂයන් කෙරෙහි අවධානය යොමුකර ඇත.

- ✓ ලියාපදිංචි සම්පූරණ සංඛ්‍යාව අනුව,
- ✓ පිරිමි ගැහැණු අනුව
- ✓ පදිංචි දිස්ත්‍රිකය හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය අනුව
- ✓ උපාධිය ලබාගත් විෂය ධාරාව අනුව
- ✓ උපාධි හදාරන ලද භාෂා මාධ්‍යය අනුව
- ✓ උපාධිය සඳහා වූ පංති සාමාර්ථය අනුව
- ✓ උපාධිය සම්පූරණ කරන ලද වර්ෂය අනුව

## විශ්ලේෂණය

- ලියාපදිංචි සම්පූරණ සංඛයාව


2019 වර්ෂය තුල ලිපාපදිංචිය ලබා ඇති සම්පූරණ සංඛයාව 1,910කි එය රත්නපුර දිස්ත්‍රික්කයේ 1,075 හා කැගල්ල දිස්ත්‍රික්කයේ 835 ලෙස වේ. ඒ අතරින් පූජ්‍ය පක්ෂය 10ක් නියෝජනය කරයි.

- ගැහැණු හා පිරිමි අනුව

ලියාපදිංචි සංඛ්‍යාවෙන් බහුතරයක් ගැහැණු නියෝජනයකි. එය සමස්ත ප්‍රමාණයෙන් 80%ක්.

උසස් අධ්‍යාපනය සඳහා යොමුවන පිරිස බහුතරය කාන්තාවන් වීම මූලික හේතුවක් විය හැකිය.

| | රත්නපුර | කැගල්ල | පළාත |
|---|---|---|---|
| පිරිමි | 243 | 143 | 386 |
| ගැහැණු | 832 | 692 | 1,524 |
| එකතුව | 1,075 | 835 | 1,910 |




- **පදිංචි දිස්ත්‍රික්කය හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය අනුව**

ලියාපදිංචි සංඛ්‍යාවෙන් රත්නපුර දිස්ත්‍රික්කය වැඩි සංඛ්‍යාවක් නියෝජනය කරයි. එම අගය 1,075කි, කෑගල්ල දිස්ත්‍රික්කය 835කි. ප්‍රතිශතය පිළිවෙලින් 56% හා 44% කි


රත්නපුර දිස්ත්‍රික්කය

| ප්‍රා.ලේ. කොට්ඨාශය | සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| අයගම | 23 | 2% |
| බලංගොඩ | 103 | 10% |
| ඇහැලියගොඩ | 65 | 6% |
| ඇලපාත | 45 | 4% |
| ඇඹිලිපිටිය | 143 | 13% |
| ගොඩකවෙල | 75 | 7% |
| ඉඹුල්පෙ | 65 | 6% |
| කහවත්ත | 30 | 3% |
| කලවාන | 55 | 5% |
| කිරිඇල්ල | 36 | 3% |
| කොලොන්න | 37 | 3% |
| කුරුවිට | 83 | 8% |
| නිවිතිගල | 39 | 4% |
| ඕපනායක | 32 | 3% |
| පැල්මඩුල්ල | 83 | 8% |
| රත්නපුර | 120 | 11% |
| වැලිගෙපොල | 41 | 4% |

කෑගල්ල දිස්ත්‍රික්කය

| ප්‍රා.ලේ. කොට්ඨාශය | සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| අරණායක | 80 | 10% |
| බුලත්කොහුපිටිය | 31 | 4% |
| දෙහිඕවිට | 54 | 6% |
| දැරණියගල | 27 | 3% |
| ගලිගමුව | 92 | 11% |
| කෑගල්ල | 121 | 14% |
| මාවනැල්ල | 125 | 15% |
| රඹුක්කන | 92 | 11% |
| රුවන්වැල්ල | 57 | 7% |
| වරකපොල | 125 | 15% |
| යටියන්තොට | 31 | 4% |


ලියාපදිංචි උපාධිධාරීන් පළාත තුල ව්‍යාප්තිය පළාතේ ජනගහනයේ පැතිරීමට අනුව සිදුව ඇත. නාගරික ප්‍රදේශ වල වැඩි අගයක් ගෙන ඇත.




- උපාධිය ලබාගත් විෂය ධාරාව අනුව

සමස්ත ප්‍රමාණයෙන් 56%ක් නියෝජනය වන්නේ කලා විෂයයන් යටතේ ලබාගත් උපාධි වේ. 21% කළමණාකරණ විෂයයන් උපාධි ද, 16% විද්‍යා විෂයයන් සඳහා ලබාගත් උපාධි නියෝජනය වේ.

| විෂය ධාරාව | රත්නපුර | කෑගල්ල | පළාත |
|---|---|---|---|
| කලා | 552 | 520 | 1,072 |
| රංග කලා | 48 | 26 | 74 |
| වානිජ | 32 | 19 | 51 |
| කළමණාකරණ | 251 | 147 | 398 |
| විද්‍යා | 167 | 125 | 292 |
| ඉංජිනේරු | 7 | 1 | 8 |
| නීති | 3 | 7 | 10 |
| වෛද | 2 | 1 | 3 |
| ඖෂධවේදී | 1 | | 1 |
| ආයුර්වේද | 1 | | 1 |
| එකතුව | 1,064 | 846 | 1,910 |





වෘත්තීය උපාධි පාඨමාලාවන් ලෙස සැලකෙන ඉංජිනේරු, වෛද, ඖෂධවේදී උපාධිධාරීන් ද මෙම කණ්ඩායමට අයත් වී ඇත.

- උපාධි හදාරන ලද භාෂා මාධ්‍යය අනුව

ප්‍රධාන භාෂා මාධ්‍යය සිංහල වී ඇත. ඉංග්‍රීසි භාෂාව ද සැලකිය යුතු සංඛ්‍යාවක් ගෙන ඇත. චීන හා ජපන් භාෂා මාධ්‍ය උපාධි 5ක් ද වේ.


| | රත්නපුර | කෑගල්ල | පළාත |
|---|---|---|---|
| සිංහල | 593 | 468 | 1,061 |
| ඉංග්‍රීසි | 473 | 328 | 801 |
| දෙමළ | 7 | 36 | 43 |
| වෙනත් | 2 | 3 | 5 |
| එකතුව | 1,075 | 835 | 1,910 |




- **උපාධිය සඳහා වූ පංති සාමාර්ථය අනුව**

උපාධිධාරීන් අතරින් 56%ක් පංති සාමාර්ථ සහිතව උපාධිය සම්පූරණ කර ඇත. ඉන් 56 දෙනෙක් ප්‍රථම පංති සාමාර්ත සහිතව සමත්ව ඇත.

| | රත්නපුර | කෑගල්ල | පළාත |
|---|---|---|---|
| පළමු පෙල | 39 | 17 | 56 |
| දෙවන පෙල (ඉහළ) | 301 | 278 | 579 |
| දෙවන පෙල (පහළ) | 262 | 175 | 437 |
| සාමාන්‍ය | 462 | 376 | 838 |
| එකතුව | 1,064 | 846 | 1,910 |




- ## උපාධිය සම්පූර්ණ කරන ලද වර්ෂය අනුව

සමීක්ෂණයේ අරමුණ අදාල වර්ෂය තුල උපාධිය අවසන් කරන කණ්ඩායම ලියාපදිංචි කර ගැනීම වුවත් වසර 15කට අයත් පිරිසක් ලියාපදිංචිය ලබා ඇත. මෙය 2019 ජනාධිපති මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ උපාධිධාරීන්ට රැකියා ලබාදීම සම්බන්ධව සඳහන් වූ කරුණුම හේතු විය හැක. එය සනාථ වන්නේ වසර අවසාන මාස දෙක තුළ සැලකිය යුතු සංඛ්‍යාවක් ලියා පදිංචිය අයදුම් කිරීමය.

| වර්ෂය | රත්නපුර | කෑගල්ල | එකතුව |
|---|---|---|---|
| 2019 | 471 | 310 | 781 |
| 2018 | 339 | 288 | 627 |
| 2017 | 161 | 150 | 311 |
| 2016 | 44 | 65 | 109 |
| 2015 | 12 | 11 | 23 |
| 2014 | 12 | 8 | 20 |
| 2013 | 6 | 2 | 8 |
| 2012 | 8 | 1 | 9 |
| 2011 | 2 | 1 | 3 |
| 2010 | 3 | 2 | 5 |
| 2009 | 0 | 0 | 0 |
| 2008 | 2 | 1 | 3 |
| 2007 | 2 | 0 | 2 |
| 2006 | 1 | 0 | 1 |
| 2005 | 0 | 1 | 1 |
| | 1,063 | 840 | 1,910 |

## නිරීක්ෂණ හා නිර්දේශ

- ලියාපදිංචිය සඳහා නොමුවන වැඩි පිරිසක් රජයේ රැකියා ලබාදීමේ වැඩසටහන් වලදී පළාත් සභාවේ ලියාපදිංචි වීම සුදුසුකමක් ලෙස සලකනු ලබන බව නිරීක්ෂණය වේ.
- රජයේ ප්‍රතිපත්ති සකස් කෙරෙන ආයතන වෙත වාර්තා කිරීම නිර්දේශ කරයි.

